ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 11,737—1959 මැයි 5 වැනි අහහරුවාද—5.5.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඛ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ජේදය—සාමාන්‍ය

අග්‍රාණඩුකාරතුමාණන් කරන පත් කිරීම්

1959 අංක 188

අ. ආ. කා. අංකය: C. 218/56 (III)

සඩදේශ කටයුතු භාර ඇමති තැන්පත් ගරු ඒ. පී. ජයසූරිය සෙනෙවි මන්ත්‍රීතුමා දිවයිනට පෙරළා පැමිණෙන තුරු 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා සවාධීනතා) රාජ සභා නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ සඩදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම් මහානාම සමරවීර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා 1959 මැයි 2 වැනි දින සිට සඩදේශ කටයුතු භාර ඇමති වශයෙන් වැඩ බැලීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කල බව මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
ආණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 මැයි 2 වැනි දින,
කොළඹ අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදී.

1959 අංක 189

අ. ආ. කා. අංකය: C. 146/48.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සංවිධායක ලිපිකරු සී. බී. ඒ. නාමධාරී ආර්. සැන්ඩ්. ඇල්. පී. දරණියගල මහතා නැවත වැඩ භාර ගන්නා තුරු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සහකාර සංවිධායක ලිපිකරු බී. කොස්වත්ත මහතා 1959 මැයි 2 වැනි දින සිට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සංවිධායක ලිපිකරු වශයෙන් වැඩ බැලීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කල බව මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 මැයි 2 වැනි දින,
කොළඹ අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේ දීය.

ආණ්ඩුවේ නිවේදන

1950 අංක 25 දරණ ආහාර පාලන පනත

අංක 122 දරණ නියෝගය

1950 අංක 25 දරණ ආහාර පාලන පණතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, ලංකාවේ එක් තැනෙක සිට ලංකාවේ තවත් තැනෙකට හාල් කිසියම් ප්‍රමාණයක් ප්‍රථමයෙන් සඳහන් කළ ස්ථානය ඇතුළත් ප්‍රදේශයේ ආහාර පාලක තැන විසින් හෝ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් හෝ සහකාර ආහාර පාලක තැන විසින් හෝ ඔවුන් වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රයක් උඩ එවැනි බලපත්‍රයකට අන්තර්ගත කොන්දේසි අනුව වීනා රථවාහන වලින් ගෙනයාම හෝ අන් අයුරකින් යැවීම මෙම නියෝගයෙන් තහනම් කරමි.

මෙම නියෝගයේ ඉහත පෙනෙන තහනම පහත සඳහන් ක්‍රියාවන්ට බලපවත්වන්නේ නැත:—

(අ) මෙරට වගා කළ හාල් සේරු 80කට වැඩි නොවන ප්‍රමාණයක් රථවාහන වලින් හෝ අන් අයුරකින් ගෙනයෑම;

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් කිසියම් හාලක් රථවාහන වලින් හෝ අන් අයුරකින් ගෙන යෑම;

(ඇ) හාල් සලාක පොතක් සහිත යමෙකු එම පොතෙන් කිසියම් කූපනයක් හාරදී ලබා ගන්නා හාල් ප්‍රමාණය එම හාල් ප්‍රමාණය ලබා ගත් ස්ථානයේ සිට එම පොත අයිතිකරුගේ නිවාස ස්ථානය කරා රථවාහන වලින් හෝ අන් අයුරකින් ගෙනයෑම; හෝ

(ඈ) නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් හෝ ඔහු වෙනුවෙන් නිකුත් කළ රිසිට්ටුවක් හෝ බලපත්‍රයක් සහිතව හෝ හාල් තොග වෙළෙන්දෙකු විසින් නිකුත් කළ රිසිට්ටුවක් සහිතව යමෙකු එම රිසිට්ටුවේ හෝ බලපත්‍රයේ සඳහන් හාල් ප්‍රමාණය එම හාල් ප්‍රමාණය ලබාගත් ස්ථානයේ සිට එම රිසිට්ටුවේ හෝ බලපත්‍රයේ සඳහන් තොග වෙළඳ තැනගේ සමූපකාරයේ හෝ බලය ලත් වෙළඳ තැනගේ ගබඩාවට හෝ වෙළඳ පොළට රථවාහන වලින් හෝ අන් අයුරකින් ගෙනයාම.

ඉහත (ඈ) යටතේ සඳහන් "තොග වෙළෙන්දෙකු" යනුවෙන් හැඟවෙන්නේ සමූපකාර බඩු ගබඩාවලට හෝ සමූපකාර කඩවලට හෝ බලය ලත් වෙළෙන්දන්ට පාලනයට යටත් වූ කිසියම් ද්‍රව්‍යයක් බෙදහරින්නකු වීම සඳහා 1952 ආහාර පාලන රෙගුලාසිවල "ඊ" ශීර්ෂයේ III වැනි කොටසේ 5 වැනි රෙගුලාසිය යටතේ නියෝජ්‍ය හෝ සහකාර ආහාර පාලකයෙකු විසින් බලය දෙන ලද 1949 අංක 21 දරන පණතින් සංශොධිත 1936 අංක 16 දරන සමූපකාර සමිති ආඥා පණතේ 6 වැනි වගන්තිය යටතේ ලියා පදිංචි කරන ලද සමූපකාර කඩ සමිති සංගමය, සමූපකාර තොග වෙළඳ ආයතනය හෝ ඒ සඳහා වෙනයම් සුදුසු පුද්ගලයෙකු වේ.

1169—ජේ. ඇන්. ආර් 1629—4,950 (4/59)

A 1

ඉහත (ඇ) යටතේ සඳහන් "බලයලත් වෙ ළෙන්දෙකු" යනුවෙන් හැඟවෙන්නේ නියෝජ්‍ය හෝ සහකාර ආහාර පාලකවරයෙකු විසින්, 1952 ආහාර පාලන රෙගුලාසිවල "ඊ" ශීර්ෂයේ III වැනි කොටසේ 5 වැනි රෙගුලාසිය මටතේ පාලනයට යටත් වූ කිසියම් ද්‍රව්‍යයක් නියමිත ප්‍රදේශවලට, ආයතනවලට හෝ කණ්ඩායම් වශයෙන් සිටින මිනිසුන්ට බෙදා හැරීම සඳහා බලය දෙනු ලැබූ වෙළෙන්දෙකු හෝ ඒ සඳහා සුදුසු වූ වෙනත් පුද්ගලයෙකු වේ.

2. 1958 නොවැම්බර් 15 වැනි දින අංක 11,586 දරණ ලංකාණ්ඩුවේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මගේ අංක 104 හා 1958 නොවැම්බර් 15 දින දරණ නියෝගය මෙයින් අවලංගු කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1959 අප්‍රියෙල් 30 වැනි දින,
කොළඹ දිය.

මිළ පාලන දැන්වීම්

1959 අංක 2 දරණ ආහාර මිළ නියෝගය

සහල්

1950 අංක 29 දරන මිළ පාලන පනත

ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත්, මෙතියස් ස්ටීවන් ක්ලිටස් ගුණවර්ධන වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් සහ ඒ සමග කියවෙන 3 (2) වැනි වගන්තියෙන් මා හට පැවරී තිබෙන බලතල අනුව—

(1) අංක 11,356 හා 1958 ජූනි 12 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 6 සහ 7,1958 ජූනි 4 වැනි දකමින් යුත් මාගේ ආහාර මිළ නියෝග 1959 අප්‍රේල් මස 27 වැනි දින සිට අවලංගු කරමි.

(2) මීට යාකොට ඇති උපලේඛනයේ සහල් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් දෙකක්ද උපලේඛනයේ පළමු වැනි තීරයේ සඳහන් පෙදෙස්වල විකිණිය හැකි වැඩිම මිළ දෙවැනි සහ තුන්වැනි තීරවල සඳහන් මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) මොනම සහල් ප්‍රමාණයක් වුවත් යලින් විකිණීම සඳහා විකිණීමක් වුවහොත් ඒ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස ගණන් ගතයුතු බවත්,

(ආ) මොනම සහල් ප්‍රමාණයක් වුවත් පාරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා විකිණීමක් බව ගණන් ගතයුතු බවත්,

(ඇ) "රාත්තල්" හෙවත් " රා " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයිස් බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවත් නියම කරමි.

(ඈ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම සහල් ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මිළ ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයේ සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම පෙදෙසෙකම වෙන ද්‍රව්‍යයකට කවලම් කොට බාලකොට කිසිවෙක් සහල් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) එසේම මෙම නියෝගයේ සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම පෙදෙසෙකම යම් තැනක හෝ යම් වාහනයක් තුළ නිමිවීමක් හෝ පාලනයක් යටතේ සහල් තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම පෙදෙසේ සහල් විකිණිය යුතු වැඩිම ගණන් දක්වන නිවේදනයක් එකී ස්ථානයේ හෝ වාහනයේ හොඳින් පෙනෙනසේ ප්‍රදර්ශනය කර තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම පෙදෙසකම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන් ද සහල් විකුණන සෑම කෙනෙකුම සහල් මිළදී ගන්නාට රිසිට් පතක් දියයුතු බව මෙයින් නියෝග කරමි. එම රිසිට් පතෙහි පහත සඳහන් ද අඩංගු විය යුතුය :—

(අ) විකුණූ දිනය,
(ආ) විකුණූ ප්‍රමාණය,
(ඇ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල,
(ඈ) වෙළෙඳාම කුමක්ද යන බව, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන බව,

(7) එසේම සහල් විකුණන විට සහල් ඔතන දැයෙහි නැතහොත් බහාලන දෙයෙහි මිළද, මෙම නියෝගයෙහි නියම කරන ලද විකිණිය හැකි වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බැව් මෙයින් නියෝග කරමි.

1959 අප්‍රෙල් මස 27 වැනි දින පෙරවරු 10 ට ගාල්ලේදී අත්සන් තබන ලදී.

ඇම්. ඇස්. සී. ගුණවර්ධන,
ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන.

උපලේඛනය

1 වැනි තීරය	2 වැනි තීරය	3 වැනි තීරය
ප්‍රදේශය	සහල් ශුද්ධ බර හොණ්ඩරයක් සඳහා වැඩිම තොග වෙළඳ මිළ	සහල් රාත්තල් දෙකක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ
	රු. ශ.	රු. ශ.
ගාලු නාගරික සීමාව සහ කඩවත් සතර ගහබඩ පත්තුව—	19 46	0 35½
බද්දේගම ගම්සභා සීමාව ඇතුළත	19 69	0 36½
තෙලිකඩ-මාපුවාන ගම්සභා සීමාව ඇතුළත	19 76	0 36½
නාගොඩ ගම්සභා සීමාව ඇතුළත (උඩුගම සහ තල්ගස්වල ගම්මුළාදෑනි වසම් හැර)	20 36	0 37
තල්ගස්වල ගම්මුළාදෑනි වසම	20 63	0 37
උඩුගම ගම්මුළාදෑනි වසම	20 50	0 37
වදුරඹ ගම්සභා සීමාව ඇතුළත	20 36	0 37
පොල්ගහවිල ගම්මුළාදෑනි වසම ඇතුළත	20 17	0 37
බෙන්තර වලල්විටි කෝරලේ බස්නාහිර, බෙන්තොට ගම්සභා සීමාව ඇතුළත	19 45	0 36
කොස්ගොඩ ගම්සභා සීමාව ඇතුළත	19 45	0 36
බෙන්තොට වලල්විටි කෝරලේ නැගෙනහිර, අම්බන විදනෙ ආරච්චි වසම ඇතුළත	19 99	0 36½
වැයිහේන ග්‍රාමසභා සීමාව ඇතුළත (නියාගම මත්තක සහ පිටිගල ගම්මුළාදෑනි වසම් හැර)	19 86	0 36
නියාගම ගම්මුළාදෑනි වසම ඇතුළත	20 22	0 37
මත්තක ගම්මුළාදෑනි වසම ඇතුළත	20 17	0 36½
පිටිගල ගම්මුළාදෑනි වසම ඇතුළත	20 08	0 36½
ඇල්පිටිය ගම්සභා සීමාව ඇතුළත (ඕමත්ත ගම්මුළාදෑනි වසම හැර)	19 86	0 36
ඕමත්ත ගම්මුළාදෑනි වසම ඇතුළත	20 06	0 36½

1 වෙනි තීරය	2 වෙනි තීරය	3 වෙනි තීරය
ප්‍රදේශය	සහල් සුද්ධ බර හොණ්ඩරයක් සඳහා වැඩිම තොග වෙළඳ මිළ	සහල් රා. 2ක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ
	රු. ශ.	රු. ශ.
වැල්ලබඩ පත්තුව—		
රත්ගම ගම්සභා සීමාව ඇතුළත	19 45 ...	0 36
හික්කඩුව ගම්සභා සීමාව ඇතුළත	19 58 ...	0 36
වේරගොඩ ගම්සභා සීමාව ඇතුළත (බටපොල ගම්මුලාදැනි වසම හැර)	19 58 ...	0 36
බටපොල ගම්සභා සීමාව ඇතුළත	19 91 ...	0 36
වතුගෙදර නගර සභා සීමාව ඇතුළත	19 58 ...	0 36
මාදම්පේ ගම්සභා සීමාව ඇතුළත	19 58 ...	0 36
කරන්දෙනිය ගම්සභා සීමාව ඇතුළත (කුරුඳුගහහැකැක්ම ගම්මුළාදැනි වසම හැර) ...	19 58 ...	0 36
අම්බලන්ගොඩ පලාත් ආණ්ඩු සභා සීමාව ඇතුළත	19 38 ...	0 35½
බලපිටිය නගර සභා සීමාව ඇතුළත	19 72 ...	0 36
හික්කඩුව නගර සභා සීමාව ඇතුළත	19 45 ...	0 35½
දෙඩන්දුව නගර සභා සීමාව ඇතුළත	19 45 ...	0 35½
කුරුඳුගහ හැකැක්ම ගම්මුළාදැනි වසම ඇතුළත	19 89 ...	0 36
කල්පේ පත්තුව—		
අහන්ගම ගම්සභා සීමාව ඇතුළත	19 52 ...	0 36
හබරාදුව ගම්සභා සීමාව ඇතුළත	19 52 ...	0 36
කෝදගොඩ ගම්සභා සීමාව ඇතුළත	19 76 ...	0 36
කොට්ටව ගම්සභා සීමාව ඇතුළත (වලවේ විදනෙ ආරච්චි වසම සහ මාගෙදර ගම්මුළාදැනි වසම හැර)	20 20 ...	0 37
වලවේ විදනෙ ආරච්චි වසම ඇතුළත	20 23 ...	0 37
මාගෙදර ගම්මුලාදැනි වසම ඇතුළත	20 31 ...	0 37
හිනිදුම පත්තුව—		
හිනිදුම ගම්සභා සීමාව ඇතුළත (එප්පල, පනන්ගල, මාවනාන, හබරකඩ සහ තවලම ගම්මුළාදැනි වසම හැර)	19 69 ...	0 38
පනන්ගල සහ එප්පල ගම්මුළාදැනි වසම් ඇතුළත	19 69 ...	0 38½
තවලම සහ හබරකඩ ගම්මුළාදැනි වසම් ඇතුළත	19 69 ...	0 38
මාවනාන ගම්මුළාදැනි වසම ඇතුළත	19 69 ...	0 38½
නෙළුව ගම්සභා සීමාව ඇතුළත	19 69 ...	0 38½
ඕපාත ගම්සභා සීමාව ඇතුළත (කලන්ගල්ල ගම්මුලාදැනි වසම හැර)	19 69 ...	0 38½
කලන්ගල්ල ගම්මුලාදැනි වසම ඇතුළත	19 69 ...	0 38

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් සහල් විකිණීමේ නියමිත මිළ නොවේ. මෙවා ඒ සහල් විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුය.

සංශොධනය

1959 අප්‍රේල් මස 4 වෙනි දින අංක 11,719 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද, 1959 මාර්තු මස 25 වෙනි දින අංක ඇම්.ඇල්.26 දරණ ආහාර මිළ නියෝගයේ 1 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් මතු පළවෙන පලාත් සඳහා එකී උපලේඛනයේ 2 සහ 3 වෙනි තීරයන්හි පිළිවෙළින් සඳහන් හාල් සහ වී පිළිබඳ මිළ ගණන් මතු සඳහන් පිළිවෙළට සංශොධනය විය යුතුය :—

	රු. ශ.	රු. ශ.
පල්ලේගම (ල.ප.ස.)	22·12 ...	11·06
ඇටන්වල, කහගල, මහලකොටුව, පිටවල, ඉමයුව, නාරන්ගමුව (ල.ප.ස.), රඹුක්කොලුව, හල්මිනිය, කිවුලේවාඩිය, වීල්ගමුව, ගල්ගෙඩවල, අකරහැඩිය	22·47 ...	11·24

1959 අප්‍රේල් මස 24 වෙනි දින,
මාතලේ කච්චෙරියේදිය.

බන්දුල ඇස්. ද සිල්වා,
මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

සංශොධනය

1959 අප්‍රේල් මස 4 වෙනි දින අංක 11,719 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1959 මාර්තු 25 වෙනි දින අංක ඇම්.ඇල්.26 දරණ ආහාර මිළ නියෝගයේ 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ විශෙෂිත මතු පළවෙන පලාත් සඳහා එකී උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් හාල් පිළිබඳ මිළ ගණන් මතු සඳහන් පිළිවෙළට සංශොධනය විය යුතුයි :—

	රු. ශ.
රජ්ජම්මන, නාරන්ගමුව (ග. ප.), දිවිල්ල, මහවෙල, උඩංගමුව, දෙරකුඹුර දෙඹිවෙල, මුවන්දෙනිය, කවුඩුපැලැල්ල, අළුත්ගම, ගුරුලවෙල, රසිතලාව, නාරන්ගොල්ල, ගල්වඩුකුඹුර, මඩවල, ගුරුබැඹිල, පල්ලේපොල, පල්දෙනිය, සුස්සැල්ල, පමුණුව, යටවත්ත, කිරිමැටියාව, වරාපිටිය-බංඩාරපොල, පුවක්පිටිය (ග. ප.)	0·19
උඩගම, පොරෝකාරගම-අළුත්ගම, සැලගම, ගම්මුල්ල, ඇඹිටියාව, අඹන්පොල, ගලේවෙල, මාතලාපිටිය, ඇටිපොල, නාලන්ද, ඉඹුල්පිටිය, ගලගම, වැටැස්යාය, පිලිහුඩුගොල්ල, කරවිලහේන, ඇහැලේපොල, මිල්ලවාන, මේල්ප්ටිය, වල්මෝරුව, දැඹව, කිරිඔරුව, නාවරගොඩ, අකුරම්බොඩ, කන්දේවත්ත, නෙළුවාකන්ද, නිකගොල්ල, සුදුහකුරුගම, බිබිල, ලේනාවල, පලාපත්වෙල, අම්බොක්ක, පල්ලේහපුවිද, එළමල්පොත, උඩස්ගිරිය, රත්වත්ත-වැලිගල, වහකෝට්ටේ, දුල්ලැව, ලෙනදෙර, වැහිගල, නයාකුඹුර, කොස්වත්ත	0·19½

1959 අප්‍රේල් මස 24 වෙනි දින,
මාතලේ කච්චෙරියේදිය.

බන්දුල ඇස්. ද සිල්වා,
මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී